## ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය

# රැකියා විරහිත උපාධිධාරීන්, සංවර්ධන නිලධාරීන් ලෙස පත්කිරීම හා පුහුණු කිරීම

දිස්ත්‍රික්ක පදනම මත රැකියා විරහිත උපාධිධාරීන්, පුහුණු කර සේවයට බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීමට රජය විසින් තීරණය කරනු ලැබ ඇත. පෞද්ගලික අංශයේ හෝ රාජ්‍ය නොවන අංශයන්හි හෝ රාජ්‍ය අංශයේ හෝ යන ඕනෑම පදනමක් මත සේවයේ නියුක්ත වී නොමැති උපාධිධාරීන් විසින් ස්වකීය අයදුම්පත්, ලිපිකවරයේ වම්පස කෙළවරේ '**උපාධිධාරීන් පුහුණු කිරීම**' යනුවෙන් සලකුණු කර ඊට යටින් ඔබ පදිංචි දිස්ත්‍රික්කය / ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය / ග්‍රාම නිලධාරී කොට්ඨාසය සඳහන් කර, පහත සඳහන් ලිපිනයට (පහත දැක්වෙන ආදර්ශ අයදුම්පතට අනුව සකස් කර) ලියාපදිංචි තැපෑලෙන් එවන්න.

**ලේකම්,**
**ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය,**
**1 වන මහල, මිලෝදා ගොඩනැගිල්ල (පැරණි ටයිම්ස් ගොඩනැගිල්ල)**
**බ්‍රිස්ටල් වීදිය, කොළඹ 01.**

අයදුම්පත් පහත දැක්වෙන වෙබ් අඩවිය හරහා එවීමට උනන්දු කරනු ලැබේ.

**http://www.mnpea.gov.lk**

වෙබ් අඩවිය මගින් අයදුම්පත් එවනු ලබන අයදුම්කරුවන් තැපැල් මගින්ද අයදුම්පත් එවීම අවශ්‍ය නැත.

නොකැලැල් චරිතයක් සහිත දිවයිනේ ඕනෑම පළාතක සේවය කිරීමට සූදානම් , කායිකව හා මානසිකව නිරෝගීමත්, වයස අවුරුදු 21 සිට 35 දක්වා වන වයස් කාණ්ඩයේ ශ්‍රී ලාංකීය පුරවැසියන් හට මේ සඳහා අයදුම් කළ හැකිය. රජය විසින් තෝරා ගනු ලබන රැකියා විරහිත උපාධිධාරීන් හට එක් අවුරුදු පුහුණු වැඩසටහනක් සපයනු ලබන අතර, සියල්ල ඇතුළුව රුපියල් 20,000.00 මාසික දීමනාවක්ද ගෙවනු ලැබේ.

**අයදුම්පත් භාරගන්නා අවසාන දිනය : 2017.09.08**

**ලේකම්,**
**ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය.**

**ආදර්ශ අයදුම් පත**

සම්පූර්ණ නම :
උපන් දිනය :
ජාතික හැඳුනුම්පත් අංකය :
ස්ත්‍රී / පුරුෂ භාවය :
ස්ථිර ලිපිනය :
ග්‍රාම නිලධාරී කොට්ඨාසය :
ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :
දිස්ත්‍රික්කය :
දුරකථන අංකය :

**අධ්‍යාපන සුදුසුකම් :**

**උපාධිය**

විශ්වවිද්‍යාලය
විශේෂ / සාමාන්‍ය / පංති සාමාර්ථය
විෂයයන්
උපාධිය වලංගු දිනය :

බාහිර ක්‍රියාකාරකම් :
විවාහක / අවිවාහක බව :
ඔබ ගැන නිර්දේශ ලබාදිය හැකි දෙදෙනෙක් : (නම, විමසුම් විස්තර)

අත්සන : දිනය :